# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.01 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 02 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## 01. මනුෂ්‍ය ඝාතනයක් - කුලියාපිටිය පොලිස් වසම.

2024.12.31 වන දින සවස් කාලයේ කුලියාපිටිය පොලිස් වසමේ පරගහරුප්ප ප්‍රදේශයේදී කාන්තාවකට තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට කුලියාපිටිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 37 ක් වූ පරගහරුප්ප, දීගල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය හා පුරුෂයා සමඟ ඇති වූ පවුල් ආරවුලක් මත බහින් බස් වීමක් දුරදිග යාම හේතුවෙන් පුරුෂයා විසින් උදැල්ලකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධියෙන් පසු පලා ගොස් සිටින සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා කුලියාපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. හදිසි අනතුරකින් පිරිමි දරුවෙකු මියයාමක් - මාවනැල්ල පොලිස් වසම.

2024.12.31 වන දින උදෑසන කාලයේ මාවනැල්ල පොලිස් වසමේ අම්බුලුගල ප්‍රදේශයේදී පිරිමි දරුවෙකු පුවක් ගසකින් ඇද වැටී මාවනැල්ල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට මාවනැල්ල පොලිසියට ලද පැමිණිල්ලක් අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 16 ක් වූ අම්බුලුගල, මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මරණකරු තවත් පිරිමි දරුවෙකු සමග කුලී පදනම යටතේ පුවක් කැඩීමට ගොස් සිටියදී පුවක් ගස කඩා වැටීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. සැකකටයුතු මරණයක් - බෝයවලාන පොලිස් වසම.

2024.12.30 වන දින බෝයවලාන පොලිස් වසමේ පහලගම ප්‍රදේශයේ පුද්ගලයෙකු අතුරුදහන්ව ඇති බවට බෝයවලාන පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

අතුරුදහන් පුද්ගලයාගේ මළ සිරුර 2024.12.31 වන දින බෝයවලාන නැබඩවතුර මාර්ගයේ ඇලක පාවෙමින් තිබියදී සොයා ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 74 ක් වූ නැබඩවත්ත, කැප්පිටිවලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදුකර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර බෝයවලාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - ඇලපාත පොලිස් වසම.

2024.12.31 වන දින උදැසන කාලයේදී ඇලපාත පොලිස් වසමේ හංගමුව ප්‍රදේශයේ පුද්ගලයෙකු විදුලි සැර වැදීමෙන් මියගොස් ඇති බවට ඇලපාත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ හංගමුව, රත්නපුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සතුන්ගෙන් ආරක්ෂා කරගැනීමට කුඹුරකට යොදන ලද අනවසර විදුලි රැහැනක මරණකරු ගැටී විදුලි සැර වැදීමෙන් මෙම අනතුරට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනවසර විදුලි රැහැන් අදින ලද සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඇලපාත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.12.31 වන දින උදැසන කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ හතර ගේට්ටුව ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 270 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - වාද්දුව පොලිස් ස්ථානය.

2024.12.31 වන දින සවස් කාලයේ වාද්දුව පොලිස් වසමේ ග්‍රාම සංවර්ධන පාර ප්‍රදේශයේදී වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 26 ක් වන වාද්දුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2024.12.31 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ කටුබැද්ද ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 420 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.12.31 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වදුල්ලවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 490 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. විදේශීය ජාතිකයෙකු කොකේන් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ ගාල්ල ඒකකය.**

2024.12.31 වන දින සවස් කාලයේ ශ්‍රී ලංකා රේගුවේ ගාල්ල ඒකක පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ ගාල්ල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කොකේන් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 ක් සහ ග්‍රෑම් 06 ක් බරැති මත්පෙති 12 ක් තැපැල් මඟින් මෙරටට ආනයනය කිරිම හා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් විදේශීය ජාතිකයෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන ස්පාඤ්ඤ ජාතිකයෙකු වේ.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ ගාල්ල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය අංශය.**

2024.12.31 වන දින සවස් කාලයේ මිරිහාන පොලිස් වසමේ රාහුලපුර ප්‍රදේශයේදී නුගේගොඩ කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 33 මිලි ලීටර් 750 ක් (බෝතල් 45)** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මිරිහාන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන මාදිවෙල, කෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන ලද විදේශීය මත්පැන් හා විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගුවන්තොටුපල පොලිස් ස්ථානය.**

2024.12.31 වන දින අළුයම් කාලයේ කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී ගුවන්තොටුපල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද විදේශීය මත්පැන් බෝතල් 125 ක් හා විදේශීය දුම්වැටි 8960 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගුවන්තොටුපල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කල සැකකරුවෙකු අත්අඩංගුවට - ඇඹිලිපිටිය පොලිස් ස්ථානය.**

2024.12.31 වන දින සවස් කාලයේ ඇඹිලිපිටිය පොලිස් වසමේ උඩගම ප්‍රදේශයේ නිවසක් තුල පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් සිදු කිරීමක් සම්බන්ධයෙන් ඇඹිලිපිටිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කල සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන ගල්බොරැල්ල, කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැටලීම සිදුකරන ලද ස්ථානයේ තිබී රන් ආලේපිත බුදු පිළිම 02 ක්, කළු පැහැති ගල් මංජුසාවක්, නිල් පැහැති මැණික් බවට සැකකරන ගල් 03 ක්, රෝස පැහැති මැණික් බවට සැකකරන ගල් 02 ක්, කලු පැහැති මැණික් බවට සැකකරන ගලක් පොලිස් භාරයට ගෙන ඇත.

ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඔයාමඩුව පොලිස් ස්ථානය.

2024.12.31 වන දින දහවල් කාලයේ ඔයාමඩුව පොලිස් වසමේ මානිංගමුව ප්‍රදේශයේදී ඔයාමඩුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන ඇලයාපත්තුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඔයාමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. බෝම්බ ප්‍රහාරයක් - පුස්සැල්ලාව පොලිස් වසම

2024.12.31 වන දින උදෑසන කාලයේ පුස්සැල්ලාව පොලිස් වසමේ උඩගම අටබාගේ රෝහලේ සායනයකට සහභාගි වූ රෝගීන් දස දෙනෙකු හා රෝහල් කාර්ය මණ්ඩලයේ සිව් දෙනෙකු බඹර ප්‍රහාරයකට ලක්ව ඇත.

එම සායනයට පැමිණි රෝගීන් දස දෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා ගම්පොල රෝහල වෙතත්, රෝහල් කාර්ය මණ්ඩලයේ සිව්දෙනා අටබාගේ රෝහලටත් ඇතුලත් කර ප්‍රතිකාර ලැබීමෙන් පසු ගම්පොල රෝහලට ඇතුලත් කරන ලද පුද්ගලයින් නව දෙනෙකු හා අටබාගේ රෝහලේ ප්‍රතිකාර ලැබූ පුද්ගලයින් දෙදෙනෙකු පිටව ගොස් ඇත.

පුස්සැල්ලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - උළුක්කුලම පොලිස් වසම.

2024.12.31 වන දින දහවල් කාලයේ උළුක්කුලම පොලිස් වසමේ අවරන්තුලාව පාවක්කුලම මාර්ගයේ යුනිට් 02 ප්‍රදේශයේදී වව්නියාව දෙස සිට යුනිට් 07 දෙසට ධාවනය වූ බස් රථයක අතුරු මාර්ගයක සිට කුඩා දරුවෙකු පදවාගෙන පැමිණි පාපැදියක් බස් රථයේ බඳ කොටසේ ගැටී පාපැදියේ පදවනු ලැබූ දරුවෙකු එම බස් රථයේ පිටුපස රෝදයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදියේ ගමන් කල දරුවා පාවක්කුලම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 07 ක් වූ යුනිට් 02, පාවක්කුලම ප්‍රදේශයේ පදිංචි පාසැල් දරුවෙකි.**

මෘත ශරීරය වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. උළුක්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.

2024.12.31 වන දින සවස් කාලයේ තලංගම පොලිස් වසමේ අකුරේගොඩ මාර්ගයේ අරුප්පිටිය ප්‍රදේශයේදී ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගය දෙස සිට අකුරේගොඩ නව යුද හමුදා මූලස්ථානය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට

පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගය මැද දූපතෙහි ගැටී විසිවී ගොස් මැද දූපතෙහි සවි කර ඇති විදුලි පහන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු තලංගම රෝහලට ඇතුලත් කර පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා මුල්ලේරියාව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මුල්ලේරියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 17. මාරක රිය අනතුරක් - හපුතලේ පොලිස් වසම.

2024.12.31 වන දින දහවල් කාලයේ හපුතලේ පොලිස් වසමේ බෙරගල හාලිඇල මාර්ගයේ විහාරගල බෝක්කුව අසලදී හපුතලේ දෙස සිට බෙරගල දෙසට ධාවනය වූ වෑන් රථයක තිරිංග අක්‍රිය වීමෙන් රථය, මාර්ගයේ පහලට ධාවනය වී පෙරළී යාමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් වෑන් රථයේ ගමන් කළ රියදුරු ඇතුලු පුද්ගලයින් 10 දෙනෙකු බරපතල තුවාල ලබා දියතලාව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පුද්ගලයෙකු හා කාන්තාවක් මියගොස් ඇත. රියදුරු ඇතුළු රෝගීන් 05 දෙනෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා බදුල්ල රෝහලට මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 86 ක් හා මරණකාරිය වයස අවුරුදු 50 ක් වූ හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර දියතලාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හපුතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**